# බටහිරයන් අසමත් කරමු

බටහිරයන් මෙරට සම්බන්ධයෙන් අනුගමනය කරන ප්‍රතිපත්තිය කුමක්ද? යන්න පිළිබඳව මෙතෙක් අප ලියා ඇති දේ කෙටි විමර්ශනයකට ලක් කිරීමට අකාෂි විසින් කර ඇති ප්‍රකාශයෙන් අවස්ථාවක් ලැබී ඇත. අකාෂි කියා ඇති දෙයින් ගම්‍ය වන්නේ ඊනියා සටන් විරාම නිරීක්ෂණ කමිටුවට තත්ත්වය පාලනය කිරීමට නොහැකි නම් එක්සත් ජාතීන්ගේ හමුදා ගෙන්වන බව ය. ඔහු ඒ ප්‍රකාශය කළේ නිෂේධාර්ථයකින් බව සැබෑ ය. එහෙත් අපට අවශ්‍ය වන්නේ ප්‍රකාශයෙන් කියැවෙන දෙයින් අපට කුමක් බලාපොරොත්තු විය හැකි ද යන්න ය. අකාෂිගේ ප්‍රකාශය අපට පුදුමයක් නො වෙයි. එක්සත් ජාතීන්ගේ හමුදා මෙරටට ගෙන්වීමට ඇති ඉඩකඩ පිළිබඳව අපි මේ තීරුවේ ද කලකට පෙර සඳහන් කළෙමු. මේ අතර රජයේ ප්‍රවෘත්තිවලට අනුව ලංකාවේ ඇමරිකා තානාපති කියා ඇත්තේ යුදමය තත්ත්වයක් ඇතිවුවහොත් ඇමරිකානු එක්සත් ජනපදය ලංකාවට ආධාර කරන බව ය. මේ ආධාර කිරීම කුමන ආකාරයකින් සිදු විය හැකිද? ඒ කෙසේ වෙතත් ප්‍රකාශය සත්‍ය නම් ඉන් කියැවෙන්නේ ලංකාවේ තවමත් යුදමය තත්ත්වයක් නැති බව ය. යුදමය තත්ත්වයක් නැති රටක ඊනියා සටන් විරාම ගිවිසුමක් ක්‍රියාත්මක වීම ද ප්‍රශ්නයකි. සටන් විරාම ගිවිසුමට පෙර යුදමය තත්ත්වයක් තිබිණි නම් ප්‍රකාශය අනුව ඇමරිකාව ලංකාවට ආධාර කිරීමට ඉදිරිපත් වීමට තිබිණි යැයි අපට සිතිය හැකි ය.

එක් එක් අය ඒ ඒ අවස්ථාවේ කරන ප්‍රකාශ හේතුවෙන් ජනතාව අන්දමන්ද වී ඇත්නම් ඒ පුදුමයට කරුණක් නො වේ. මේ ප්‍රකාශ සමග බ්‍රිතානි ජනමාධ්‍ය ප්‍රචාරය කරන ප්‍රවෘත්ති ද සැලකිල්ලට ගත යුතු ය. පසුගිය දා සාම්පූර් ප්‍රහාරයේ දී හතලිස්දහසකට වැඩි පිරිසක් අවතැන් වී යැයි බීබීසිය කියා ඇත. ඒ ප්‍රවෘත්තිය පසුව නිවැරදි කළේ යැයි කියනු ලැබෙයි. එහෙත් ප්‍රශ්නය ලෝකයට ම ජනමාධ්‍යවේදය උගන්වන්නේ යැයි කියන බීබීසිය වැරදි ප්‍රවෘත්තියක් ප්‍රචාරය කිරීමට පෙර ඒ ගැන ආණ්ඩුවෙන් හෝ වෙනත් දෙවැනි ප්‍රභවයකින් අසා නොබැලුවේ ඇයි ද යන්න ය. බීබීසිය කොටින්ගෙන් ලැබුණු ඊනියා ප්‍රවෘත්තිය වෙනත් කිසිවකුගෙන් නොවිමසා ම ප්‍රචාරය කළේ ය. බීබීසිය හා කොටි අතර ඇත්තේ ඉතා කිට්ටු සම්බන්ධයකි. බටහිරයන් ඉතා පැහැදිලිව ම සිටින්නේ කොටි සමග ය. ඔවුහු කොටින්ගේ ප්‍රචාරකයෝ වෙති. ටික කලකට පෙර ශ්‍රී ලංකා ගුවන් යානයකින් ආපසු ලන්ඩනය බලා යමින් සිටි බීබීසී වාර්තාකරුවකු බීමත්ව සිංහලයන් දෙමළ ජනයාට කරන ඊනියා වෙනස්කම් ගැන තර්ජනාත්මක ව කතාකර ඇත.

මෙරට දෙමළ ජාතිවාදී ප්‍රශ්නයේ නිර්මාතෘවරයා ඕලන්ද හෙවත් නෙදර්ලන්තය වුව ද දෙමළ ජාතිවාදය හදා වඩනු ලැබුයේ බ්‍රිතානිය විසිනි. මෙරට සිදුවන්නේ කුමක් ද යන්න තේරුම්ගත හැක්කේ මෑත ඉතිහාසය බ්‍රිතානීන් උගන්වා ඇති ආකාරයට නොව අපේ දෘෂ්ටිකෝණයකින් විමසා බැලීමෙනි. අනෙක් රටවල ද තම සංස්කෘතිය ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාව බටහිරයන්ට ඇත. ඒ ගලා එන්නේ යුදෙව් සම්ප්‍රදායෙනි. ඒ ඒ රටේ සංස්කෘතියට විරුද්ධව ඒ ඒ රටේ ජාතික දේශපාලන ආධිපත්‍යයට එරෙහිව හා ජාතික ආර්ථික රටාවට විරුද්ධව කටයුතු කිරීම බටහිරයන්ගේ ප්‍රතිපත්තිය වෙයි. මෙරට ඔවුහු සිංහලත්වයට එරෙහිව කටයුතු කරති. ලන්දේසීහු සිංහලත්වය වැනසීමේ ක්‍රියාවලියේදී වගා ආර්ථිකයක් (දුම්කොළ) ඇති කිරීම සඳහා දකුණු ඉන්දියාවෙන් යාපනයට ගොවීන් ගෙන ආහ. එකල යාපනයේ වැඩිවශයෙන් සිටියෝ සිංහලයෝ වූහ. ඔවුන්ට අමතරව කේරළයෙන් ගෙන ආ වේලක්කාර හමුදාවන්ගෙන් පැවැතෙන්නෝ වූහ. ලන්දේසීන් ගෙන ආ දෙමළ ගොවීන්ගෙන් හා ඉහත කී පිරිස්වලින් වත්මන් යාපන ජනගහනය ඇතිවිණි. ගොවියෝ වෙල්ලාල කුලයට ද සිංහලයෝ දෙමළ සංස්කෘතිය තුළ කෝවියාර්, නලවාර් ආදී කුලවලට ද අයත් වූහ. ලන්දේසීහු සිංහල රජවරුන්ට නැගෙනහිර වෙරළ අහිමි කිරීම සඳහා දෙමළ උගතුන් ලවා අලුත් ඉතිහාසයක් නිර්මාණය කළහ. එහි ආරම්භය යාල්පානම් වෛපව මාලෙයි විය. ඉංගිරිසීහු මේ දෙමළ ජනයා වැදගත්කමින් ලංකාවේ ප්‍රධාන ජනවර්ගය බවට පත් කිරීමට සවිඥානික ව උත්සාහ කළහ. තමන්ට කිසි දිනෙක යුද්ධයකින් පරාජය කළ නොහැකි වූ සිංහලයන් සමග බටහිරයන්ගේ එදත් අදත් ඇත්තේ වෛරයකි. බ්‍රිතානීන් සිංහලත්වය නැසීමට ආරම්භයේ සිට ම දෙමළ ජනයා යොදාගත්හ. එයට අමතරව අනෙක් රටවල දී මෙන් ම ඔවුන්ගේ අධ්‍යාපනය හා ආර්ථික රටාවන් ද යොදාගත්හ. බටහිරයන් අප පාලනය කෙළේ තුවක්කුවෙන් පමණක් නො වේ. අද නම් ප්‍රධාන වශයෙන් ම ලෝකය පාලනය කිරීම සඳහා ඔවුන් යොදා ගන්නේ ඔවුන්ගේ දැනුම ය. එහි දී බටහිර විද්‍යාව මෙන් ම බටහිර සමාජයීය විද්‍යා ද ඉටුකරන්නේ අප රටවලට ද්‍රෝහී පිළිවෙතකි. ඔවුන්ගේ සාහිත්‍යය

© Prof. Nalin De Silva

හා කලා විචාරය ද ඇතුළු කලාකෘතීන් ගැන කීම අනවශ්‍ය ය. අද සති අන්ත පත්තර කඩමාල්ලක් විසින් මහා ඝෝෂාවක් බවට පත්කිරීමට උත්සාහ කරන එහෙත් අධෝවාතයකට වඩා වැඩිදෙයක් නොවන ඊනියා අසමත් රාජ්‍යය පිළිබඳ සංකල්පය ද බටහිරයන් විශේෂයෙන් ම තමන්ට විරුද්ධ ව්‍යාපාර ඇති රටවල් පෑගීමට යොදා ගන්නා සංකල්පයක් පමණ ය. මේ සංකල්පයේ ද ඇත්තේ ශබ්දයකට වඩා දුර්ගන්ධයකි. අද දැනුම් ආධිපත්‍යය ඇති බටහිරයෝ තමන්ට අවශ්‍ය දේ කර ගැනීම සඳහා සංකල්ප නිපදවති. අසමත් රාජ්‍යයක් පිළිබඳ ඊනියා වාස්තවික නිර්ණායක නැත. ඒ නිර්ණායක අර

පත්තර කඩමාල්ලේ කර්තෘගේ නිර්මාණ නො වේ. ඔහුට නිර්මාණ පිළිබඳ කිසිම සමත්කමක් නැත. ඒ නිර්ණායක බටහිරයන්ගේ ය. මේ නිර්ණායකවලින් එක් අතකින් කියැවෙන්නේ බටහිරයන්ගේ අසමත්වීමක් ගැන ය. තම ආර්ථික දේශපාලනික හා සංස්කෘතික රටාවට ගොනුකර ගැනීමට බටහිරයන් මෙතෙක් අසමත් වී ඇති රාජ්‍ය අසමත් රාජ්‍ය යැයි අපට එක් අතකින් හැඳින්විය හැකි ය. මේ පිළිබඳ විස්තරයක් පසුව කරමි. බටහිරයන්ට අනුව ලංකාවටත් වඩා අසමත් රාජ්‍ය විසිගණනක් ඇති බව පමණක් දැනට සඳහන් කරමි.

බ්‍රිතානියෝ ආරම්භයේ සිට ම ලංකාවේ දෙමළ ජනයාගෙන් තෝරාගත් පිරිසකට වෙනත් අයට නොමැති වරප්‍රසාද ලබාදුන්හ. පසුව ඒ වරප්‍රසාද අඩුකිරීම දෙමළ ජනයාට කරන අසාධාරණයක් ලෙස බ්‍රිතානීහු ලෝ පුරා ප්‍රචාරය කළහ. දෙමළ ජාතිවාදය ලෝකයේ සම්භාවනීය තත්ත්වයකට පත්කරනු ලැබුයේ බ්‍රිතානීන් විසිනි. අද ද දෙමළ ජාතිවාදයේ ගාමක බලය වනුයේ බ්‍රිතානිය ය. නෝර්වේ, ජපානය හා වෙනත් රටවල් අපට පෙනෙන්නට ඉදිරියට දමා ඇත. අකාශි යනු බටහිර අවශ්‍යතාවන් පිරිමසින අයකු පමණ ය. ඔහු බෞද්ධයකු නිසාත් ලංකාවට ඊනියා ආධාර හෙවත් ණය වඩාත් ම ලබාදෙන්නා ජපානය නිසාත් බටහිරයන්ට ලංකාව සම්බන්ධයෙන් ඔහුගේ වැදගත්කම වැඩි වෙයි. අද බටහිරයෝ සිංහලයන්ට හා ලංකාවට එරෙහිව සමස්තයක් ලෙස දෙමළ ජාතිවාදය ද විශේෂයෙන් කොටි සංවිධානය ද යොදා ගනිති. ඊනියා සටන් විරාම ගිවිසුම කැඩීමට ආණ්ඩුවට අයිතියක් නැති වුව ද කොටි ආණ්ඩුවක් නොවන බැවින් ඔවුන්ට ඕනෑම දෙයක් කළ හැකි බවට මතයක් බටහිරයන් නිර්මාණය කර ඇත. කොටි ගිවිසුම කැඩුව ද ඔවුන්ට දඬුවමක් නැත. එසේ වුවත් ප්‍රභාකරන්ගේ හැසිරීම අද බටහිරට ද ප්‍රශ්නයක් වෙමින් ඇත. එවැනි අවස්ථාවක බටහිරයන් කරන්නේ හැකිනම් ප්‍රභාකරන් ඉවත්කර වෙනත් නායකයකු පත්කර ගැනීමට කටයුතු කිරීම ය. එසේත් නැතිනම් කොටි සංවිධානයම වෙනුවට වෙනත් සංවිධානයක් යොදා ගැනීම ය. මේ බව ද අප කලකට පෙර කියා ඇත. බටහිරයන්ගේ මූලික වෑයම ඊනියා සාකච්ඡා මගින් මෙරට සඟසන්ධීය රාජ්‍යයක් ඇතිකර සිංහලයන්ට තව තවත් පහර ගැසීම ය. ප්‍රභාකරන්ගේ ක්‍රියාකලාපය එයට බාධාවක් වුවහොත් ඔවුන් හැකි නම් ප්‍රභාකරන් අත්හැර වෙනත් ත්‍රස්තවාදියකු ඒ සඳහා යොදවා ගැනීමට කටයුතු කරනු ඇත. ඒ බැරිනම් ඔවුන් කොටි ද පරාජය කර වෙනත් දෙමළ ජාතිවාදී සංවිධානයක් යොදාගනු ඇත. එක්සත් ජාතීන්ගේ යැයි කියන එහෙත් බටහිරයන් මෙහෙයවන හමුදා ලංකාවට ගෙන ඒමට අරඅඳින්නේ අපට ආදරයෙන් නොව ඉහත කී කරුණු දෙකෙන් එකක් ඉටුකර ගැනීමට ය. යුදමය තත්ත්වයක් ඇතිවුවහොත් ඇමරිකාව ආධාර දෙන්නේ යැයි කියන්නේ ප්‍රභාකරන් ප්‍රශ්නයක් වුවහොත් ඔහු හෝ කොටි මුළුමනින් ම හෝ ඉවත් කිරීමට එක්සත් ජාතීන්ගේ හමුදා හෝ වෙනත් හමුදා හෝ යොදවන බව කීමටය. ඒ එකකින්වත් ලංකාවට එතරම් වැඩක් නොවනු ඇත්තේ ඒ වෙනුවට වෙනත් ත්‍රස්තවාදියකු හෝ දෙමළ ජාතිවාදී සංවිධානයක් හෝ බටහිරයන්ගේ අනුග්‍රහයෙන් පත් වී නැවතත් ඊනියා සාම සාකච්ඡා අරඹන බැවින් ය. අපට පරාජය කිරීමට ඇත්තේ බටහිරයන් හා ඔවුන්ගේ ප්‍රචාරයන් ය. තර්කයෙන් හා වාදයෙන් ඔවුන්ගේ කසිකබල් මතවාද පරාජය කිරීම මහාකප්පක්වත් අර පත්තර කඩමාල්ලේ කර්තෘ ඇතුළු දරුණු හීනමානයකින් පෙළෙන ඒ නිසා සිංහලත්වයට විරුද්ධව කුලියට ලියන්නන් සිතන අන්දමට ඒ මතවාද දේවභාෂිතයන් නො වේ. පත්තරයක් සඟරාවක් ජනතාව අතරට ගෙනයෑමට අසමත් ඊනියා ජනමාධ්‍යවේදීන් තම ස්වාමිවරුන්ගේ මත පුනරුච්චාරණය කරමින් අසමත් රාජ්‍යයක් ගැන කතා කිරීම විහිළුවකි. ඒ කෙසේ වෙතත් බටහිරයන්ට ඇති ප්‍රචාරක ජාලය පරාජය කිරීමට අප උත්සාහ දැරිය යුතු ය. එක් අතකින් බලන කල ඊනියා සටන් විරාම නිරීක්ෂණ කමිටුව එක්සත් ජාතීන්ගේ හමුදාවක පෙරහුරුවක් ලෙස දැන් දැකිය හැකි ය. නිරීක්ෂකයන්ගේ කාර්යභාරය වුයේ සාකච්ඡා සඳහා වාතාවරණය සකස් කිරීම ය. ඊනියා නිරීක්ෂකයන්ට නිරීක්ෂණය හැර කොටි සම්බන්ධයෙන් පියවරක් ගැනීම තහනම් විය. නිරීක්ෂකයෝ සිංහලත්වයට විරුද්ධව කොටින්ට ආධාර කළහ. සාකච්ඡා යන්න ඔවුන්ගේ මන්තරය විය. එහෙත් ප්‍රභාකරන් බටහිරයන්ට ද ප්‍රශ්නයක් වෙමින් සිටියි. ඔහු මෙල්ල කර සාකච්ඡාවට ගැනීමට නිරීක්ෂකයන් අසමත් නම් ඒ

© Prof. Nalin De Silva

සඳහා වෙනත් පියවර ගැනීමට බටහිරයෝ සූදානම් වෙති. බටහිරයන් දැන් අපට පකෂය යන මතය පිටුදැකිය යුතු ය. බටහිරයන් අසමත් කිරීමට අපි කටයුතු කරමු.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva